# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 81 — 1973 ඔක්තෝබර් 12 වැනි සිකුරාදා — 1973.10.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු — ඇබෑර්තු ... ... ... ... | 1385 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1400 |



සැලකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 39 දරන විනිමය පාලන (සංශෝධන) පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 40 දරන දුම්කොළ බදු (සංශෝධන) පනත හා ජාතික රාජ්‍ය සභාවේ 41 දරණ ණය සහනදායක (සංශෝධන) පනත 1973 ඔක්තෝබර් 12 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ අතිරේකයන් වශයෙන් පලවේ.

## තනතුරු — ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරවනු ලබන රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාළවන පොදු කොන්දේසි

**1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

**1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.**

**"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි.**

1 : 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනෙක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත්. රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදළ නොවන්නේ ය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාල තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන් ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

2. දීමනා

2 : 1 ඒ ඒ තනතුරට අදාල මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ, VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්ති යෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනාවක් ගෙවනු ඇත.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

---

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප්/වේතන ලබන ගණයට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය තැන මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

**3. සේවා කොන්දේසි : සාමාන්‍ය**

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම් කරනු ලැබිය හැක.

**4. ස්ථිර පත්වීම දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

4 :1 ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසි වලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ :—

4 :1 :1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 :1 :2 රාජ්‍ය සේවයෙහි " නව ප්‍රවේශකයන් " වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්වන්නාවූත්, අනාගතයේ දී පනවනු ලැබිය හැකිවූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 :3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි සථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද් දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීනතා පරීක්‍ෂණයෙහි II වැනි ශ්‍රෙණියෙන් සමත් වීමත් (අවශ්‍ය නම්), අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්‍ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්මී නව මාස හයක කල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දැක්වෙන 4 : 1 : 5 වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේ ය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේ දී සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4, සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේ ය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේව යෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විටෙක්හි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

**5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් සියයට 9% ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් නව 6% ක් දක්වා වූ සෙච්ඡා දායක මුදලක් එම කරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමිම් තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972. 01. 01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම් නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනාත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

**6. යුද්ධ සේවා අනුග්‍රහය**

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාවතීර්ණ හමුදාවන්හි සේවා මුක්ත භටයන්ටද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමුන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්වී නොගිය අයට ද ඉහත කී සියලුම සුදුසුකම් තිබේනම්ද, ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 5 වැනි දිනට පෙරාතු නම්ද ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස් වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තමතමන් සේවය කළ කාලයන් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

7 : 1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරට තෝරාගනු ලැබුව හොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

7 : 2 නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

7 : 3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරාගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතු වනු ඇත.

7 : 4 අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම්කිසි සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්; තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

7 : 5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

**8. සුදුසුකම පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

8 : 1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

---

**මහනුවර දිස්ත්‍රික්කයේ කඳුකර ඉහළ නැගෙනහිර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ උඩපලාත කොට්ඨාශයේ විවාහ (උඩරට සහ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

කඳුකර ඉහළ නැගෙනහිර උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගේ සැලකුම් ලබන, ඉල්ලුම් පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 කට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම් කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳව සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මංඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් වියයුතු අතර ඒවා 1973, ඔක්තෝබර් මස 30 වෙනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් මා වෙත ලැබෙනසේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

සී. සී. ඊ. පොන්සේකා,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1973 සැප්තැම්බර් මස 24 වැනි දින,
මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය.

10-253—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

**මහනුවර දිස්ත්‍රික්කයේ කඳුකර ඉහළ බටහිර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ උඩපලාත කොට්ඨාශයේ විවාහ (උඩරට සහ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

කඳුකර ඉහළ බටහිර උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගේ සැලකුම් ලබන, ඉල්ලුම් පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 කට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳව සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මංඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර ඒවා 1973 ඔක්තෝබර් මස 30 වෙනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් මා වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

සී. සී. ඊ. පොන්සේකා,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1973 සැප්තැම්බර් මස 24 වැනි දින,
මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය.

10-254—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

**මහනුවර දිස්ත්‍රික්කයේ හැටන් කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ උඩබුලත්ගම කොට්ඨාශයේ විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

හැටන් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගේ සැලකුම් ලබන, ඉල්ලුම් පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 කට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳව සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මංඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර ඒවා 1973 නොවැම්බර් මස 02 වෙනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් මා වෙත ලැබෙනසේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

සී. සී. ඊ. පොන්සේකා,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1973 සැප්තැම්බර් මස 24 වැනි දින,
මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය.

10-255—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

අංකය : ආ 1/4/34

## නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යාංශය

### සහකාර වෙළඳ නැව් අධ්‍යක්ෂ (වාණිජ) තනතුර

නැව් කටයුතු සහ සංචාරක කටයුතු අමාත්‍යාංශයේ වෙළඳ නැව් අංශයේ සහකාර අධ්‍යක්ෂ (වාණිජ) තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ.

ඉල්ලුම් පත්‍රය පහත දක්වා ඇති ආකෘතිය අනුව පිළියෙල කොට, 1973 ඔක්තෝබර් 31 දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

**සටහන.**—ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්තිය හා කොන්දේසි.**—තනතුර ස්ථිරය. තෝරා ගනු ලැබූ අපේක්ෂකයා රජයේ, අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය—වර්ෂයකට රුපියල් 6,720—360 × 12 සහ 480 × 11—රුපියල් 16,320 වර්ෂයකට රුපියල් 11,040 ට සහ රුපියල් 14,480 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.—(1969. 10. 01 වැනි දිනට පෙර මූලික වාර්ෂික වැටුප් ක්‍රමය, රුපියල් 4,080—360 × 12 හා 480 × 10—රුපියල් 13,200 යි. වර්ෂයකට රුපියල් 8,400 හා රු. 11,760 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.)

**සටහන.**—(1) තෝරාගනු ලබන අයදුම්කරු ඔහුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් ඒකාබද්ධ වැටුප් ක්‍රමයේ ආරම්භක වැටුපට වඩා උසස් වැටුපක තැබීමේ ප්‍රශ්නය රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කොට සලකා බලනු ලැබේ.

(2) ඔහු ලංකා විශ්ව විද්‍යාලයේ හෝ වෙනත් පිළිගත් විශ්ව විද්‍යාලයක නැව් කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලැබූ තත්ත්වයක පශ්චාත් උපාධියක් ලබා නොගතහොත් හා ලබා ගන්නා තුරු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රුපියල් 11,040 වැටුප් පියවර ඉක්මවා වැටුප් ලැබීමට හිමි නොවේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1973. 10. 31 වැනි දිනට වයස අවුරුදු 30 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහල වයස් සීමාව වූ අවුරුදු 45 රජයේ සේවකයන්ට අදාල නොවනු ඇත.

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ 1 වැනි හෝ 2 වැනි පන්තියේ ගෞරව උපාධියක් හෝ එම විෂයයන් වඩා උසස් සහතිකයක්, සහ

(ඩී) රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, හෝ පිළිගත් වෙළඳ ආයතනයක හෝ වාණිජ ක්ෂේත්‍රයේ 5 අවුරුද්දකට නො අඩු පළපුරුද්දක් ලබා තිබීම.

**සටහන.**—නැව් කටයුතු පිළිබඳ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උප කෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ) ;

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය ;

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය ;

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ. යු.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවශ්‍යතාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම මෙම අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍රය මෙම කාර්යාලයට ලැබුණු බව අයදුම්කරුවන් වෙත දන්වනු ලැබේ.

පී. බී. කරඳවල,
ලේකම්.

1973 සැප්තැම්බර් 28 වැනි දින,
කොළඹ 1, චැතැම් වීදියේ අංක 54 හි,
නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ දීය.

### සහකාර වෙළඳ නැව් අධ්‍යක්ෂ (වාණිජ) තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

(සැ. යු.—ඉල්ලුම් පත්‍රය බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ "සහකාර අධ්‍යක්ෂ (වාණිජ) තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා, එය ලියා පදිංචි තැපෑලෙන්, කොළඹ 1, තැ. පෙ. අංක 576, නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.)

(1) සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය හා ස්ථානය :
(1973. 10. 31 දිනට වයස :——, අවුරුදු :——, මාස :——, දින :——.)

(4) ජාතිය :————.

(5) විවාහකද, අවිවාහකද යන බව :————.

(6) අධ්‍යාපන සුදුසුකම් :————.

(7) වෘත්තීය සුදුසුකම් :————.

(8) පාසලෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර : (සේවය භාරගැනීමේ සහ අස්වීමේ දින සහ අස්වීමට හේතු සඳහන් කළ යුතුය.)————.

(9) දැනට කරන රක්ෂාව :————.

(10) චරිත සහතික දී ඇති පුද්ගලයන්ගේ නම් :————.

මා විසින් මෙම අයදුම් පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද, මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුනහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමටද, මේ තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැන ගන්නට ලැබුනහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට බැඳී ඇති බව මම දනිමි.

————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10-236—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

### මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල පල්ලේසිය පත්තුවේ (මාරක හා හඳුන්ගමුව යන ග්‍රාම සේවක වසම් වලින් යුක්ත වන) ගැඹුරු ඔය කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය

මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල පල්ලේසිය පත්තුවේ (මාරක හා හඳුන්ගමුව යන ග්‍රාමසේවක වසම් වලින් යුක්ත වන) ගැඹුරුඔය කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා මෙහි 3 වෙනි ඡේදයේ දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1973 ඔක්තෝබර් මස 31 වෙනි දිනට හෝ ඊට පෙර, මාතලේ දිසාපති වෙත එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරුවන් ඉහත 1 වෙනි ඡේදයේ දැක්වෙන ප්‍රදේශයෙහි ස්ථිර පදිංචිකරුවන් වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි 7 වෙනි ප්‍රමාණයෙන් වත් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන් ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින් ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට සුදුසු අය නොවෙති. ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර භාරගනු නො ලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නො ලැබේ. අයදුම් පත් ලේඛණගත තැපැලෙන් එවිය යුතුවේ.

සිරිල් ගමගේ,
මාතලේ දිසාපති.

1973. 09. 28 වෙනි දින,
මාතලේ දිසාපති කාර්යාලයේ දීය.

මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල පල්ලේසිය පත්තුවේ (මාරක හා හඳුන්ගමුව යන ග්‍රාමසේවක වසම් වලින් යුක්ත වන) ගැඹුරු ඔය කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නාමය සමඟ පැහැදිලි අකුරෙන්)
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :
(ආ) උපන් දිනය සහ ස්ථානය :————.
5. විවාහක අවිවාහක බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කළේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
9. තමන් සතු දේපොලවල වටිනාකම සහ ප්‍රමාණයන්, විස්තර සහිතව :————.
10. ඉල්ලුම්කරු ණයගැතිව සිටීද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ? :————.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10–290—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

**කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ මැද පත්තුවේ ඌරුවල් පේරුව ගම් සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ මැද පත්තුවේ ඌරුවල් පේරුව ගම්සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම් පත් කරන ලෙස මෙයින් ආරාධනා කරමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1973 ඔක්තෝබර් මස 27 වැනි දිනට පෙර ඉඹුල්ගොඩ-මහර ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනට ලැබෙන සේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10 බැගින් ගෙවනු ලැබේ.

3. අයදුම්කරුට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්තවීම.

(ඇ) අයදුම්කරු ඉහත කී ඌරුවල් පේරුව ගම් සහා ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) (i) 1925 සිට 1944 කාලයෙහි සිංහල පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම- හෝ,

(ii) සිංහල භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ එයට උසස් විභාගයකින් සමත් වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන් ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන් ද, අයදුම්පත් භාර ගනු නොලැබේ.

6. අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපැලෙන් එවිය යුතුය.

ඩ. වි. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1973 සැප්තැම්බර් මස 25 දින.
කොළඹ දිසාපති කාර්යාලයේදී ය.

ආදර්ශ අයදුම් පත්‍රය

**කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ මැද පත්තුවේ ඌරුවල් පේරුව ගම් සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නාමය සමඟ පැහැදිලි අකුරෙන්)
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචි ස්ථානය සහ එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම්පත් භාරගන්නා දිනට සම්පූර්ණ වයස :————.
(ආ) උපන් දිනය සහ ස්ථානය :————.
5. විවාහක අවිවාහක බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කළේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
9. තමන් සතු දේපොලවල වටිනාකම සහ ප්‍රමාණයන්, විස්තර සහිතව :————.
10. අයදුම්කරු ණයගැතිව සිටීද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
11. අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණය මගින් දඬුවම් ලබා තිබේද ? :————.
12 මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

10–275—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

**කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරළේ ගඟබඩපත්තු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරළේ ගඟබඩපත්තු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම් කරන මෙන් මෙයින් ආරාධනා කරමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1973 ඔක්තෝබර් මස 27 වැනි දිනට පෙර කිරිඳිවැල වැකෝ උප දිසාපති තැනට ලැබෙන සේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10 බැගින් ගෙවනු ලැබේ.

3. අයදුම්කරුට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත වීම.

(ඇ) අයදුම්කරු ඉහත කී නැගෙනහිර සියනෑ කෝරළේ ගඟබඩ පත්තුව ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) (1) 1925 සිට 1944 කාලයෙහි සිංහල පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම හෝ,

(ii) සිංහල භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ එයට උසස් විභාගයකින් සමත් වීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික දෙකක්.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයින්ගෙන්ද, පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගෙන්ද, අයදුම්පත් භාරගනු නොලැබේ.

6. අයදුම්පත් ලැබුණ බවට දැන්වීමක් කරණු නොලැබේ. අයදුම්පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

ඞ. වී. ද. අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1973 සැප්තැම්බර් මස 25 දින.
කොළඹ දිසාපති කාර්යාලයේදීය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරළේ ගඟබඩ පත්තුව ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නාමය සමග පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම්පත් භාරගන්නා දිනට සම්පූර්ණ වයස :————.
(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6 අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් එය පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපොලවල වටිනාකම සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. අයදුම්කරු ණයගැතිව සිටීද? එසේනම් ඒ පිළිබඳ විස්තර :————.

11. අයදුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණය මගින් දඬුවම් ලබා තිබේද? :————.

12. මෙම තනතුරු සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10-274—73.10.12 දින අංක 81 දරන ගැසට් පත්‍රය

---

**කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළය බටහිර ප්‍රා.ආ.නි. කොට්ඨාශයට හා රයිගම් කෝරළය නැගෙනහිර උපදිසාපති කොට්ඨාශයට අයත් වන මුංවත්තබාග පත්තුව බටහිර ගම්සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළය බටහිර ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශයට හා රයිගම් කෝරළය නැගෙනහිර උප දිසාපති කොට්ඨාශයට අයත් පැල්පොල පරගස්තොට, මිල්ලනිය, ලඟාන, හල්තොට, කෙසෙල් හේනාව, බටගොඩ, යාලගල, කැන්නන්තුඩාව, වැලිකල, ගුංගමුව යන වසම් ඇතුළත් මුංවත්ත බාගෙපත්තුව බටහිර ගම්සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද අයදුම්පත් 1973 නොවැම්බර් 15 වැනි දිනට හෝ ඊට පෙර "දිසාපති කච්චේරිය කළුතර" යන ලිපිනයට ලැබෙනසේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. සුදුසුකම්.—පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30ට නොඅඩු හා 60 ට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්තවීම.

(ඇ) ඉල්ලුම්කරු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VIII වන ප්‍රමාණයෙන් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සංස්ථා හා පළාත් පාලන සේවකයින්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ද, මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම්පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

පී. ජී. පුංචිහේවා,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 සැප්තැම්බර් 28,
කළුතර දිසාපති කාර්යාලයේදීය.

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළය බටහිර ප්‍ර. ආ. නි. කොට්ඨාශයට හා පස්දුන් කෝරළය නැගෙනහිර උප දිසාපති කොට්ඨාශයට අයත්වන මුංවත්ත බාගපත්තුව බටහිර ගම්සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙලපත් නාමය සමග පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :————.

(ආ) උපන් දිනය හා ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් එය පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපොලවල වටිනාකම සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

(10) ඉල්ලුම්කරු ණයගැතිව සිටිද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(11) ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඩුවම් ලබා තිබේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(12) මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10–262—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

## තක්සේරු දෙපාර්තමේන්තුව

### II වැනි ශ්‍රේණියේ තක්සේරු පරීක්ෂක තනතුරු ප්‍රතිශෝධනය

1973 සැප්තැම්බර් මස 14 වෙනි දින අංක 77 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ඉහත සඳහන් තනතුරු සම්බන්ධයෙන් වූ නිවේදනයෙහි 4 (ඇ) ඡේදයෙහි දැක්වෙන සුදුසුකම් ප්‍රතිශෝධනය කර ඇත. දැන් අවශ්‍ය සුදුසුකම් පහත සඳහන් පරිදි විය යුතුය.

4. (ඇ) "ගණිතයෙන් සම්මාන සාමාර්ථයක් ද සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙ) විභාගයෙන් ගණිතයට සම්මාන සමාර්ථයක් ද ඇතිව වාර දෙකකට නොවැඩි ගණනකදී විෂයයන් හයකින් සමත්ව ලංකා කාර්මික විද්‍යාලයේ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හෝ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව වර්ෂ දෙකක් සතුටුදායක ලෙස හදාරා නිම කිරීම (1971/72 අධ්‍යයන වර්ෂයට පෙර ලංකා කාර්මික විද්‍යාලයේ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට බැඳුනු අය සඳහා පමණක් ගණිතයට සාමාන්‍ය සාමාර්ථයක් වුවත් ලබා තිබීම ප්‍රමාණවත් වේ.) හෝ"

ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 1973 ඔක්තෝබර් මස 27 වෙනි දින දක්වා දීර්ඝ කර ඇත.

එල්. ඕ. ද සිල්වා,
වැඩ බලන ප්‍රධාන තක්සේරුකරු.

තක්සේරු දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 561,
ගපූර් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973.09.29.

10–345—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### පොල්ගොල්ලේ සමුපකාර අභ්‍යාස විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය තනතුර

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොල්ගොල්ල සමුපකාර අභ්‍යාස විද්‍යාලයෙහි සමාජ විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය තනතුරක් සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

මෙම ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගනු ලබන අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර, කොළඹ 2, තැ. පෙ. 560, විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(අ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1973 නොවැම්බර් මස 02 වැනිදා.

(ආ) විදේශීය ඉල්ලුම්පත්‍ර : 1973 නොවැම්බර් මස 09 වැනිදා.

**සටහන් :**

(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරට අයදුම්කරුවන්ට තම ඉල්ලුම්පත්‍ර විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නතම හෝ රටට පත්කර සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවේ.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිරය.පත්වීම අර්ථ සාධක අරමුදල් පදනමක් මත වනු ඇත. තෝරගනු ලබන අපේක්ෂකයා වැටුපෙන් සියයට 6 ක මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. රජයේ දායක මුදල ඒකාබද්ධ වැටුපෙන් සියයට 9 ක් වනු ඇත. නමුත් රජයේ සේවයෙහි දැනටමත් නියුක්ත ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ අපේක්ෂකයින්ට තවදුරටත් එම විශ්‍රාම වැටුප් හිමිකම් ලැබෙනු ඇත.

(ii) (අ) තෝරාගනු ලබන බාහිර අයදුම්කරුවන් පත් කරනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදය කට යටත්වය. දැනට රජයේ ස්ථිර තනතුරක් දරණ නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් නියමිත කාලසීමාවකට වැඩ බැලීමකට පත් කරනු ඇත.

(ආ) තෝරා ගනු ලබන රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් පත් කරනු ලබන්නේ පළමුවෙන් එක් අවුරුදු කාල සීමාවකට වැඩබැලීමේ පදනමක් මතය. එම කාලය අවසානයේදී නිලධාරියා සුදුස්සෙකුබව පෙනී ගියහොත් ඔහු තනතුරේ ස්ථිර කරනු ඇත. වැඩබලන කාලය තුළදී ඔහු මෙම තනතුර සඳහා නුසුදුසු වබ පෙනී ගියහොත් ඔහු කලින් සිටි තනතුරට ආපසු යවනු ලැබේ.

3. **වැටුප් හා දීමනා.**—මේ තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය : රුපියල් 7,800 න් පටන් ගෙන රුපියල් 360 වේ වැඩිවීම් 9 කින් රුපියල් 11,040 දක්වා වැඩිවේ. (1969.10.01 දිනට පෙර පැවති වාර්ෂික අනුරූප මූලික වැටුප් ක්‍රමය රුපියල් 5,160—360—රුපියල් 8,400 වේ.)

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම පිණිස සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(ආ) 1973. 11. 02 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු බව හා අවුරුදු 40 ට නොවැඩි බව (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව බල පාන්නේ නැත) ;

(ඇ) (i) **පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව පිළිබඳ පළමුවැනි හෝ දෙවෙනි පන්තියේ ගෞරව උපාධිය.**

හෝ

(ii) **පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහ සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ ලබා තිබෙන බව.**

**සටහන.**—පළමුවෙනි හා දෙවෙනි පෙළ සම්මාන සහිත උපාධියක් සහ ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඇ) සිංහල භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් දේශන පැවැත් වීමට හැකි බව ;

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂක තැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයකුගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපත් හෝ ඇමිණිය යුතු නොවේ.

(ii) ඉල්ලා සිටි අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත හැර කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ 1 වෙනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. ඉල්ලුම්පත්‍ර මෙම කාර්යාලයයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම මා වෙත දැනුම් දිය යුතුය.

ජයන්ත කැලේගම,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 02 දින,
කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330 හි,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

(අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය)

**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව—සමාජ විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය තනතුර**

1 සම්පූර්ණ නම: (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැන්විය යුතුය) :————.

3. (අ) උපන් දිනය :—
වර්ෂය :——, මාසය :——, දිනය :————

(ආ) දේශීය ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :—
වර්ෂ :——, මාස :——, දින :————.

4. ඔබ ලංකා රටවැසියෙක්ද? පාරම්පරික රටවැසියෙක්ද? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක්ද යන බව සඳහන් කරන්න (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සහතිකයේ යොමු අංකය හා දිනය සඳහන් කරන්න) :————.

5. උපන් ස්ථානය :————.

(අ) අයදුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

(ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු/ඇ උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේක (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක්ද, වැන්දඹුවක්ද යන වග :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12 න් පසු ඉගෙනිම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :—

**සාමාන්‍ය අධ්‍යාපනය :**

පාඨශාලාව හෝ විද්‍යාලයය :—

1 :———— ———— සිට ———— දක්වා
2 :———— ———— සිට ———— දක්වා

**වෘත්තීය අධ්‍යාපනය :**

ආයතනය :—

1 :———— ———— සිට ———— දක්වා
2 :———— ———— සිට ———— දක්වා

9. ක්‍රීඩා පිළිබඳ ලබා ඇති විශිෂ්ඨත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිවයුතු පදවි පිළිබඳ විස්තර :————.

10. ඔබ ණය ගැති භාවයෙන් මිදී සිටින්නේද? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණකටද?————.

11. ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබුවෙක්ද? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

12. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.
(ලබාගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ට සමර්ථ, වෘත්තීය සුදුසුකම්වල විස්තර, ඒවායේ දින හා පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න.)

13. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් : ————.

(රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.)

| | පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |

සැලකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහල 15 වෙනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

14. විශේෂ සුදුසුකම් :————.

(දැන්වීමෙහි දැක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද? එසේ ඇතහොත් දිනයන්ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. (විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇත්දැයි ගැසට් නිවේදනය බලන්න.)

15. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

16. මෙම අයදුම්පතෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

## ලංකා ගමනා ගමන මණ්ඩලය

### පුරප්පාඩු

මණ්ඩලීය සේවාවේ පහත සඳහන් තනතුරු සඳහා සලකා බැලීම පිණිස ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**(1) III ශ්‍රේණියේ ගණකාධිකාරීන්**

**වැටුප් ක්‍රමය:**

(සියළුම දීමනාවන් ඇතුළුව මසකට) රු. 1,100—50 × 12—රු. 1,700. රු. 1,350 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

**සුදුසුකම් :**

(අ) වයස.— 1973. 10. 25 වෙනි දිනට වයස අවුරුදු 27-35 අතරවීම.

(ආ) අවම වශයෙන් අවුරුදු 2 ක පශ්චාත් උපාධි පළපුරුද්දක් ලබා ඇති වරලත් ගණකාධිකාරීන් වීම.

(ඇ) සිංහල ප්‍රවීණතාවය ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**කර්තව්‍යයන් :**

වෙනත් කර්තව්‍යයන් අතර ආයතනයේ මුදල් කටයුතු පිළිබඳව වගකීමද අඩංගුවේ. තෝරාගනු ලබන අයදුම්කරුවන්ගෙන් පිළිවෙත් ආරම්භ කිරීම සහ වැඩි දියුණු කිරීම බලාපොරොත්තුවේ. තවද, ඔවුන් වෙත ආරම්භක ශක්තිය සහ දක්ෂතාවයද තිබිය යුතු අතර ප්‍රතිඵල ලබාගැනීමේ ශක්තියද තිබිය යුතු වන්නේය.

**(2) III ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්**

**වැටුප් ක්‍රමය :**

(සියළු දීමනාවන් ඇතුළුව මසකට) රු. 1,100—50 × 12—රු. 1,700. රු. 1,350 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

**සුදුසුකම් :**

(අ) වයස.— 1973. 10. 25 වෙනි දිනට වයස අවුරුදු 27-35 අතරවීම.

(ආ) ඇම්. බී. බී. ඇස්. (ලංකා) උපාධිය ලබා තිබීම සහ අවම වශයෙන් අවුරුදු 3 ක පශ්චාත් උපාධි පළපුරුද්දක් ලබා තිබීම.

**(3) V ශ්‍රේණියේ සහකාර වෛද්‍ය වෘත්තික**

**වැටුප් ක්‍රමය :**

(සියළු දීමනාවන් ඇතුළුව මසකට) රු. 600—40 × 10—රු. 1,000. රු. 800 සහ රු. 920 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

**සුදුසුකම් :**

(අ) වයස.— 1973. 10. 25 වෙනි දිනට වයස අවුරුදු 25-35 අතරවීම.

(ආ) ලංකා වෛද්‍ය විද්‍යාලයේ ඇපොතිකරී වරුන්ගේ විභාගය සමත්වීම හා අවම වශයෙන් අවුරුදු 3 ක පළපුරුද්දක් ලබා තිබීම.

(4) (අ) රාජ්‍ය සේවාවේ හෝ පළාත් පාලන සේවාවෙහි සිටින නිලධාරීන් ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ ඒ ඒ දෙපාර්තමේන්තු මගිනි. එම ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලබන්නේ එම දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් 1957 තේ 48 අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 9 වෙනි වගන්තිය අනුව මණ්ඩලය යටතේ සේවය කිරීමට එම නිලධාරීන් නිදහස් කිරීමට එකග වෙතොත් පමණකි.

(ආ) සංයුක්ත මණ්ඩලවල සිටින්නාවූද, දැන්වීම් අනුව සුදුසුකම් ඇත්තාවූද නිලධාරීන් එවන ඉල්ලුම් පත්‍ර සැලකිල්ලට භාජනය කරන්නේ ඒ නිලධාරීන් දැන් සේවය කරන සංයුක්ත මණ්ඩලයේ සභාපති මහතා හෝ සාමාන්‍යාධිකාරී මහතා ඔවුන් (පත්කිරීමට) තේරුනොත් තම සේවාවෙන් නිදහස් කිරීමට එකග වෙතොත් පමණකි. ඉල්ලුම් පත්‍ර සංයුක්ත මණ්ඩලය මගින් එවිය යුතුයි.

**(5) සේවා කොන්දේසි :**

තෝරාගනු ලබන අපේක්ෂකයින් පළමුවෙනි වතාවට තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත්කරනු ලැබේ. ඔවුන් පහත සඳහන් වන කොන්දේසිවලට යටත්විය යුතුයි :—

1. පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.
2. දැනටමත් පණවා ඇත්තාවූද, කලින් කල පණවනු ලබන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදිය යුතුයි.
3. ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස්, ප්‍රවාසන කාලය තුලදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයේ සිංහල ප්‍රවීණත්වයක් ලබාගත යුතුයි.
4. මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 6 ක දායක මුදල් ගෙවිය යුතුයි. මණ්ඩලීය දායක මුදල සියයට 9 කි.
5. ලංකා කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාශයෙහිත් සේවය කිරීමට කැමති විය යුතුයි.

6. පහත දක්වා ඇති ආදර්ශ ෆෝරමය අනුව සකස් කල ඉල්ලුම් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත 1973 ඔක්තෝබර් මස 25 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනා ගමන මණ්ඩලයේ
සේවක මණ්ඩල කළමනාකාර තැන.

කොළඹ 5, කිරුළ පාරේ,
අංක 200 වෙනි ස්ථානයේදීය.

## ලංකා ගමනා ගමන මණ්ඩලය

### (ඉල්ලුම් පත්‍ර ෆෝර්මය)

1. ඉල්ලන තනතුර :————.

2. ඉල්ලුම්කරුවාගේ සම්පූර්ණ නම :————.

3. ලියුම් ලැබෙන පිළිවෙල :————.

4. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව අනු පිටපතක් අමුණන්න.)

5. 1973. 10. 25 දිනට වයස :—
අවුරුදු :————, මාස : ————, දවස් : ————.

6. ලාංකිකයෙකුවූයේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග :
:————.

7. විවාහක, අවිවාහකද යන බව :————.
(විවාහක නම් විවාහවූ දිනයත් දරුවන් ගණනත් ඔවුන්ගේ වයසත් සඳහන් කරන්න.)

8. ද්විතීය පාඨශාලා අධ්‍යයනය :————.
(ඉගෙනීම ලැබූ පාඨශාලාවද, සමත් වූ විභාගයද දිනයත් සහිතව සඳහන් කරන්න.)

9. උසස් අධ්‍යයනය.—(ඔබ ඉගෙනීම ලැබූ විද්‍යායතන, සාමාර්ථය ලත් විභාග, වෘත්තීය සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න.) :————.
(සහතික පත්‍රවල මුල් පිටපත් නොව, අනු පිටපත් අමුණන්න.)

10. වෛධික සුදුසුකම්.—(ඔබ ඉගෙනීම ලැබූ ආයතන, සමත්වූ විභාග, ලබා ඇති සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න.)
(සහතික පත්‍රවල මුල් පිටපත් නොව අනු පිටපත් අමුණන්න.)

11. (පාසැලෙන් අස්වූදා සිට කළ රක්ෂාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. එනම්, ඇරු පදවියේ හා සේවා යෝජකයාගේ නම, පත්වූ දිනය, රක්ෂාවෙන් අස්වූ හෝ අස්කළ දිනය, රක්ෂාවෙන් අස්වීමට හේතු යන මේ කරුණු.) :————.

12. වෘත්තීය පරිචය හෝ රාජ්‍ය සේවාවේ හෝ පළාත් පාලන සේවාවේ හෝ වෙළඳ ආයතනයක හෝ අන් කිසි ආයතනයක විධායක තනතුරක වැඩ කිරීමේ පළපුරුද්ද පිළිබඳ විස්තර: (ඇරු තනතුරු, කළ කටයුතු, සියළු දීමනාවන් ඇතුළුවූ පඩි යන මේවා දිනයන් සහිතව සඳහන් කරන්න.) :————.

13. මේ තනතුර ඉල්ලීමට තමාට ඇති විශේෂ සුදුසුකම් :————.
(මේ තනතුරට ඔබේ සුදුසුකම වැඩි කරවන්නාවූද, යථෝක්ත තනතුරු දරද්දී ඔබ කළාවූද වැඩ පිළිබඳ සංක්ෂේප විස්තරයක් ලියන්න.) :————.

14. සිංහල භාෂාව—ඉගෙනගත් ඉහළම ප්‍රමාණය :————.

15. මීට කලින් ඔබ ලංකා ගමනා ගමන මණ්ඩලයේ කිසියම් තනතුරක් ඉල්ලා ඇත්තේද? එසේ නම් එහි ප්‍රතිඵලය කුමක්ද?
:————.

16. සෙසු විස්තර :————.

17. යම් ක්‍රිමිනල් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියකදී වරදකරුවෙකු වූයේදැයි සඳහන් කරන්න. වරදකරුවෙකු වූයේ නම් විස්තර සඳහන් කරන්න :————.

18. ඔබ ගැන තොරතුරු දැනගැනීමට සුදුසු තැනැත්තන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න :—
1. ————.
2. ————.

මා විසින් දක්වා ඇති යථෝක්ත තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙහි අඩංගු යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තේරීමට කලින් දැන ගතහොත් මා නුසුදුස්සකු විය හැකි නියාව හා තෝරාගැනීමෙන් පසුව දැනගතහොත් වන්දි ගෙවීමක් නැතිව මා සේවාවෙන් පහකර දැමීමට සිදුවිය හැකි නියාව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුවාගේ අත්සන.

දිනය :————.

10-392—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

**කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ තාවකාලික වෙළඳහල් කළමනාකාර තනතුර**

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ තාවකාලික වෙළඳහල් කළමනාකාර තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් මෙයින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් පහත දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කර 1973 ඔක්තෝබර් මස 30 දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් පරිමාණය රුපියල් 4,152—17×144 සහ 4×180 රු. 7,320 වේ.

3. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි :—

(අ) මෙම තනතුර තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරාගන්නා අපේක්ෂකයා රජයේ සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) රජයේ ස්ථිර නිලධාරියකු මෙම තනතුරට තෝරාගනු ලැබුව හොත් ඔහු අළුමුවෙන්ම නියමිත කාලයකට වැඩ බැලීමේ පදනමක් මත පත් කෙරෙනු ඇත.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

(1) උසස් කරනු ලබන්නවුන් සඳහා—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී ලබාගත් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් යුත් අධ්‍යයන පොදු සහතික හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව සිටිය යුතුය.

සහ

(ආ) (i) ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ගෘහ කර්මාන්ත වෙළඳ සැලක සහකාර කළමනාකාර තනතුරේ අවුරුදු 3 කට නො අඩුවූ සේවා කාලයක් තිබිය යුතුය.

හෝ

(ii) ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ පරිපාලක තනතුරක සතුටුදායක ලෙස අවුරුදු 5 කට නො අඩු අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**සටහන.**—වාණිජ හා අලෙවි කටයුතු පිළිබඳ ගැටළු අතින් දැනීමක් සහ පළපුරුද්දක් ඇති අය ගැන විශේෂයෙන් සළකා බලනු ලැබේ.

(2) කෙළින්ම බඳවාගන්නවුන් සඳහා :—

(අ) වාණිජ ඩිප්ලෝමා සහතික පත්‍රය සඳහා වූ දෙවැනි විභාගය හෝ

(ආ) ලේකම්වරුන්ගේ චාර්ටඩ් ආයතනයේ මධ්‍ය (ඉන්ටර්) විභාගය, හෝ

(ඇ) පොත් තබන්නන් සඳහා වූ උසස් සහතික විභාගය හෝ සමත්ව සිටිය යුතුය.

**සටහන.**—විශාල වෙළඳ ව්‍යාපාරික ආයතනයක කළමනාකරුවකු හෝ පරිපාලකයකු වශයෙන් පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(3) සෑම අයදුම්කරුවකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ආ) 1973.10.30 දිනට වයස අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි බව. (දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අයට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

5. අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු. උපකෘත පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කර ඇති බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි සහතිකය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

(ඈ) වෘත්තිය හා/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) සිංහල භාෂාවෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

**සංලක්‍ෂ්‍යය.**—(i) ඉල්ලුම් පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපත් නොඇමිණිය යුතුය.

(ii) ලියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් ගැන සළකා බලනු නොලැබේ.

6. දැනට රජය යටතේ හෝ ප්‍රාදේශිය බල මණ්ඩලය යටතේ හෝ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්කරුවන් ස්වකීය වියදමින්ම කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පැමිණිය යුතුය.

8. අයදුම්පතේ ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බැව් තෝරාගනු ලැබීමට ප්‍රථම සොයාගතහොත් අයදුම්කරු නුසුදුස්සකු කිරීමට ද, තෝරාගනු ලැබීමෙන් පසු සොයා ගතහොත් සේවයෙන් පහ කිරීමට ද සිදුවනු ඇත.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIආ) වන ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නාවූද, රාජ්‍යසේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන්නාවූද කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ජී. පී. හත්තොටුව,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කළමනාකාරිත්ව),
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙනුවට.

1973. 10. 2 දින,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
ගේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.

තාවකාලික වෙළඳහල් කළමනාකාර තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

(සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම් පස මුදුන් කෙළවරේ "තාවකාලික වෙළඳහල් කළමනාකාර තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි කළ තැපෑලෙන් කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය.)

4. ජාතිය :————.

5. විවාහකද, අවිවාහකද යන බව :————.

6. අධ්‍යාපන හා/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

7. පාඨශාලාවෙන් අස් වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස සංස්ථාවක් සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.

9. යම්කිසි සාපරාධි වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදි කරුවී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳව විස්තර සඳහන් කරන්න :————.

10. චරිත සහතික දී ඇති පුද්ගලයන් දෙදෙනාගේ නම් සහ පදවි නාම :————.

මෙම අයදුම්පතෙහි දැක්වෙන සියලු විස්තර සත්‍ය බවද, නිවැරදි බව ද මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ පත්වීම් දෙන්නට පෙර හෙළිවුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගුවීමටද, පත්වීම ලැබූ වාට පසු හෙළිවුවහොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත්වන බව මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—

10-404—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

#### අත්කම් මෝස්තර සම්පාදක තනතුර

කුඩාකර්මාන්ත දෙපාර්තමේන්තුවේ අත්කම් මෝස්තර සම්පාදක තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම්කරුවන් මෙහි දැක්වෙන ආකෘතිය අනුව ඉල්ලුම් පත්‍ර පිළියෙල කර 1973 නොවැම්බර් මස 01 දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

**2. වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 6,024—144×4—180×8—රු. 8,040 දක්වා වැඩිවන ඒකාබද්ධ වැටුපක් මෙම තනතුරට හිමිවේ.

වාර්ෂික වැටුප රු. 6,780 සහ රු. 7,500ට පෙර කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණ වලින් සමත් විය යුතුය.

3. සේවයේ නියුක්ත කරවීම:—

(i) මෙම තනතුර ස්ථිරය.

(ii) විශ්‍රාම වැටුප් රහිතය.

(iii) රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.—ඉල්ලුම් කරුවන් පහත සඳහන් සුදුසුකම් වලින් සමන්විත විය යුතුය. ඒ බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, අංක ගණිතය/ගණිතය, චිත්‍ර කර්මය ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ) විභාගය හෝ ඊටසමාන හෝ උසස් විභාගයක් සමත්වූ සහතිකයක් තිබිය යුතුය.

(ආ) ලී කැටයම්, වෙස් මුහුණු, ලාක්ෂා, වේවැල්, උණලී, අං, ආදී අත්කම් භාණ්ඩනැනීම පිළිබඳ අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් තිබීම

සහ

(ඇ) ඉහත අත්කම්භාණ්ඩ සඳහා නව මෝස්තර සකස් කිරීම පිළිබඳව විශේෂ දක්ෂතාවයක් තිබීම.

(ඈ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

(ඉ) 1973 නොවැම්බර් මස 01 දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපවත්වන්නේ නැත.)

5. ඉල්ලුම් කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට අමුණා එවිය යුතුය. (එම පිටපත් ආපසු එවනු නොලැබේ.) :—

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය.

(**සැ. යු.**—උපකෘත පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික හා බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක්.

(ඈ) වෘත්තීය හා/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

**සංලක්ෂ්‍යය :**—ඉහත අ, ආ, ඇ, ඈ හි දැක්වෙන සහතික ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ ඉල්ලුම් පත් ගැන සලකා බලනු ලැබේ.

6. දැනට රජය යටතේ හෝ ප්‍රාදේශීය බල මණ්ඩල යටතේ හෝ සේවයේ යෙදී සිටින ඉල්ලුම්කරුවන් ස්වකීය ඉල්ලුම් පත්‍ර එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

7. ඉල්ලුම්කරුවන් ස්වකීය වියදමින් කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂනයකට පැමිණිය යුතුය.

8. ඉල්ලුම් පත්‍රයේ ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය බැව් තෝරා ගනු ලැබීමට ප්‍රථම සොයා ගතහොත් ඉල්ලුම් කරුවන් නුසුදුස්සන් කිරීමටද, තෝරා ගනු ලැබීමෙන් පසු සොයා ගතහොත් සේවයෙන් පහ කිරීමටද සිදුවනු ඇත.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නා වූ ද, රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන්නාවූද, පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ජී. පී. හත්තොටුව,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කළමනාකාරිත්ව),
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙනුවට.

1973 ඔක්තෝබර් මස 01 වැනි දින,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

#### අත්කම් මෝස්තර සම්පාදක තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

(**සැ. යු.**—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ " අත්කම් මෝස්තර සම්පාදක තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය " යන පාඨය ලියා එය ලියාපදිංචි තැපෑලෙන් කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව, හේමාස් ගොඩනැගිල්ල, කොළඹ 1 යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය.)

4. ජාතිය :————.

5. විවාහකද අවිවාහකද යන බව :————.

6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසු කම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එසින් අස්වීමට හේතුව සඳහන් කරන්න.

9. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න :
————.

10. චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදවි නාමය :—

(i)
(ii)
(iii)

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————

10–406—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය

#### යාන්ත්‍රික ෆෝර්මන් තනතුර

ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ, පුල්මුඩේ ඉල්මනයිට් යන්ත්‍රාගාරයේ යාන්ත්‍රික ෆෝර්මන් තනතුර සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුර ස්ථිර වන අතර, අර්ථසාධක අරමුදලේ අනුග්‍රහයන් ලැබෙනවා ඇත.

**වේතන පරිමාණය.**—තනතුරට අදාල මාසික ඒකාබද්ධ වැටුප 1. රු. 450—4×25—550. 2. රු. 550—8×25 හෝ (ඉහළ ශ්‍රේණිය)

**සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය විෂයයන් 6 කින් සමත් වීම. පිළිගත් ඉංජිනේරු ආයතනයක හෝ කාර්මික ආයතනයක අවුරුදු 4ක ආධුනිකත්වයක් සමග පිළිගත් ඉංජිනේරු ආයතනයක හෝ කාර්මික ආයතනයක සුපරීක්ෂක තත්ත්වයේ අවුරුදු 3 ක පළපුරුද්ද ලබා තිබිය යුතුයි.

පහත සඳහන් කාර්යයන් පිළිබඳවද අයදුම්කරු විසින් මනා දැනුමක් ලබා තිබිය යුතුයි.

ඩීසල් හා පෙට්‍රල් එන්ජින්, ට්‍රැක්ටර්, හයිඩ්‍රොලික් සහ හයිඩ්‍රොලික් පොම්ප, බරවාහන, වැලිකණින යන්ත්‍ර, එක්ස්කැවේටර්, ආදිය අළුත් වැඩියා කිරීම හා නඩත්තු කිරීම.

ඔක්සි ඇසිටිලින් හා විද්‍යුත් පෑස්සීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම හා අමතර කොටස් මිලදී ගැනීම.

**වයස :** 1973 ඔක්තෝබර් 31 වැනි දිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුයි.

අධ්‍යාපන සුදුසුකම්, වයස, පළපුරුද්ද, දැනට කරන රැකියාව, දැනට ලැබෙන වේතනය ආදී විස්තර සහ ඔබ පෞද්ගලික වශයෙන් හඳුනන ඔබ රැකියාව කළ ආයතනවල දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සමග අධ්‍යාපන හා උප්පැන්න සහතිකවල පිටපත්ද සමගින් ඔබේ අයදුම් පත, කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ පිහිටි ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ සභාපති තැන වෙත 1973 ඔක්තෝබර් මස 31 වැනි දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ පැමිණ භාරදිය යුතුයි.

එස්. ඉගලහේවා,
ලේකම්/පිරිස් කළමනාකාර.

ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය,
167, ශ්‍රී විපුලසේන මාවත, කොළඹ 10.

10–391—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරි ඇබෑර්තු

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සංඥා බලකායේ නිලධාරි ඇබෑර්තු සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. තෝරා පදත් කර ගනු ලබන අපේක්ෂකයින්ට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ලුතිනන් නිලයෙහි ස්ථිර අධිකාරි පත්වීම් පිරිනමනු ලැබේ.

3. (අ) පත්වීම් ලැබීමේදී තෝරා පත් කර ගනු ලබන අපේක්ෂකයින්ට පහත දක්වා ඇති පරිදි නිලයට අනුකූලව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. මේජර් නිලයට ඉහල උසස් කිරීම් තේරීම් අනුව වේ :—

ලුතිනන් : වාර්ෂික වැටුප රු. 7,500—5×180—රු. 8,400 (මාසික වැටුප රු. 625—5×15—රු. 700)

කපිතාන් : වාර්ෂික වැටුප රු. 9,240—8×180—රු. 10,680 (මාසික වැටුප රු. 770—8×15—රු. 890)

මේජර් : වාර්ෂික වැටුප රු. 11,400—8×240—රු. 13,320 (මාසික වැටුප රු. 950—8×20—රු. 1,110)

ලුතිනන් කර්නල් : වාර්ෂික වැටුප රු. 15,000—7×360—රු. 17,520 (මාසික වැටුප රු. 1,250—7×30—රු. 1,460).

(ආ) පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ :—

**විවාහක නිලධාරීන්ගේ දීමනාව**

| | | |
|---|---|---|
| මසකට රු. 575 හා රු. 600 ට | — | මසකට රු. 80.00 |
| මසකට රු. 600 හා රු. 625 ට | — | මසකට රු. 82.50 |
| මසකට රු. 625 හා රු. 650 ට | — | මසකට රු. 85.00 |
| මසකට රු. 650 හා රු. 675 ට | — | මසකට රු. 87.50 |
| මසකට රු. 675 හා රු. 700 ට | — | මසකට රු. 90.00 |
| මසකට රු. 700 හා රු. 725 ට | — | මසකට රු. 92.50 |
| මසකට රු. 725 හා රු. 750 ට | — | මසකට රු. 95.00 |
| මසකට රු. 750 හා රු. 775 ට | — | මසකට රු. 97.50 |
| මසකට රු. 775 හා ඉන් ඉහළ | — | මසකට රු. 100.00 |

**වෙනත් දීමනා :**

(i) මූලික නිල ඇඳුම් දීමනාව රු. 1,000,00

(ii) නිල ඇඳුම් පවත්වා ගැනීමේ දීමනාව මසකට රු. 25.00

(iii) අනුගාමික දීමනාව—විවාහක නිලධාරීන්ට සහ පිටත වාසය කිරීමට අවසර ලත් අවිවාහක නිලධාරීන්ට මසකට රු. 75.00ක්.

(iv) වෙන්ව සිටීමේ දීමනාව :

(i) සාමාන්‍ය රාජකාරි සඳහා තුල වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට, දින 14 කට නොවැඩි අඛණ්ඩ කාලයක් තුල වාසය කිරීම සඳහා දිනකට රු. 1.50 බැගින්,

(ii) හදිසි හා විශේෂ රාජකාරී සඳහා තුල වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට දින 14 කට වැඩිවන අඛණ්ඩ කාලයක් තුල වාසය කිරීම සඳහා දිනකට රු. 2.00 බැගින්.

(v) ගමන් හා ඒකාබද්ධ දීමනා.—රජයේ සේවකයන්ට ගෙවන අයුරුය.

(ඇ) නිලධාරීන්ගේ වැටුප්, මතු බලාපොරොත්තු සහ සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි ඔවුන් කෙරෙහි බලපවත්වනු ඇත :—

(i) 1961 අප්‍රේල් මස 28 දින අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ කලින් කල සංශෝධිත 1961 යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.

(ii) 1949 ඔක්තෝබර් මස 10 දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ කලින් කල සංශෝධිත 1949 නිලධාරීන්ගේ රෙගුලාසි.

(iii) 1961 සැප්තැම්බර් මස 28 දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ කලින් කල සංශෝධිත 1961 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය.

වෙනත් වැඩි විස්තර කොළඹ යුද්ධ හමුදා මූලස්ථානයෙන් ලබා ගත හැකි ය.

4. අපේක්ෂකයින් විසින් පහත සඳහන් කොන්දේසි සපුරා ලිය යුතුය :—

**(අ) ජාතිය : ඉල්ලුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.**

(ආ) වයස : ඉල්ලුම්කරුවන් 1973.11.01 දිනට වයස අවුරුදු 26 කට නොවැඩි විය යුතු ය.

(ඇ) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් : පහත පෙන්වා ඇති සුදුසුකම් ඉල්ලුම් කරවන්ට තිබිය යුතුය :

පිළිගත් විශ්ව විද්‍යාලයක බී.එස්. සී. හෝ බී.එස්.සී. ඉංජිනේරු හෝ පස් වසරක ඩිප්ලෝමා පාඨමාලාව.

විද්‍යුත් විදුලි ඉංජිනේරු පිළිබඳ සුදුසුකම් ඇති අයවලුන්ට සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඈ) සෞඛ්‍ය තත්වය : ඉල්ලුම්කරුවන් යුද්ධ හමුදාවට අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වය සපුරා ලීමට සුදුසුකම් ලබා තිබිය යුතු ය.

(ඉ) අනන්‍යතාව ඔප්පු කිරීම : ඉල්ලුම්කරුවන් විසින් ඔවුනගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල් පති විසින් හෝ නිකුත් කරන ලද හඳුනා ගැනීමේ පත්‍ර සහ රථවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද වාහන පැදවීමේ බලපත්‍ර පිළිගනු ලැබේ.

5. පහත දක්වා ඇති ආකෘතියේ අන්දමට ඉල්ලුම් පත්‍ර තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතු අතර, 1973.11.01 දින දහවල් 12ට හෝ ඊට පෙර හෝ ලැබෙන සේ යුද්ධ හමුදා මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතු ය. ඉල්ලුම් පත්‍ර බහාලන කවරයේ වම් උඩ කෙළවරේ “ශ්‍රී ලංකා සංඥා බලකායේ නිලධාරි ඇබෑර්තු සඳහා ඉල්ලුම් පත්‍රය” යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම් පත්‍ර භාර ගනු ලබන අවසාන දිනයට හා වේලාවට පසුව මෙම මූලස්ථානය වෙත ලැබෙන අයදුම් පත්‍ර භාර ගනු නොලැබේ. අයදුම් පත්‍ර නිකුත් කරනු නොලැබේ.

6. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලුම් පත්‍ර ඔවුනගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, යම්කිසි නිලධාරියෙකු තෝරා පත් කර ගනු ලැබුවහොත්, ඔහුව සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතු ය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළහොත්, රජයේ විශ්‍රාම වැටුප් සේවා කාලය යුද්ධ හමුදා විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

7. පහත සඳහන් ලියකියවිලි වල පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති අධ්‍යාපනික සහතිකය/වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතිකය.

(ඇ) අඩු වශයෙන් චරිත සහතික පත්‍ර දෙකක්, මෙම සහතික ඉල්ලුම්කරු පුද්ගලිකවම දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයින්ගෙන් මෑතකදී ලබාගත් ඒවා විය යුතුය.

8. ලැබෙන ඉල්ලුම් පත් සංඛ්‍යාව ගැන සළකා බලා, අවශ්‍ය වුව හොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරා පත් කර ගැනීම කරනු ලබන්නේ යථෝක්ත අයුරු තෝරා ගනු ලැබූ ඉල්ලුම් කරුවන්, ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන ඉල්ලුම්කරුවන්ට, එය පවත්වන ස්ථානය, දිනය හා වේලාවන් ලියා දන්වනු ලැබේ.. සම්මුඛ පරීක්ෂණය කොළඹ දී පැවැත්වෙන අතර, ඒ සඳහා වන ගමන් වියදම් හෝ වෙනත් වියදම් හෝ ශ්‍රී ලංකා ජනරජයෙන් ගෙවනු නොලැබේ.

9. තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණත ක්‍රියාත්මක කිරීම අරභයා දැනටමත් පනවා ඇති හෝ මතු පනවනු ලැබිය හැකි හෝ නීති රීති වලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

10. තනතුර විශ්‍රාම වැටුප් සහිත නොවේ. අර්ථ සාධක අරමුදලක් සඳහා තම දායක මුදල් වශයෙන් තම ඒකාබද්ධ වැටුපෙන් සියයට හයක් අඩුකර ගැනීමට තම කැමැත්ත දෙන බවට තෝරා ගනු ලබන අපේක්ෂකයින් විසින් ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු වන්නේ ය. සේවා විශ්‍රාම වැටුපකට හෝ පාරිතෝෂික දීමනාවක් පිළිබඳව 1961 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයෙහි ඇති රෙගුලාසි මෙම තනතුර සඳහා අදාල නොවන්නේ ය.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද්ධ හමුදාපති වෙනුවට.

1973 ඔක්තෝබර් 01 දින.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සංඥා බලකායේ නිලධාරි ඇබෑර්තු සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———.

2. ජාතිය :———.
(ලාංකිකයෙකු වූයේ පෙළපතින් ද නැතහොත් ලියා පදිංචි කිරීමෙන් ද ?, ලියා පදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න.)

3. ලිපිනය :———.

4. උපන් දිනය :———.
1973.11.01 දිනට වයස :— අවුරුදු : ——. මාස :——. දින :—.

5. සම්පූර්ණ නම, උපන් ස්ථානය හා වත්මන් ලිපිනය :—
(අ) පියාගේ :———.
(ආ) මවගේ :———.

6. ඔබ විවාහක ද ? අවිවාහක ද ? :———.

7. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩා ශූරත්වයන් :———.

8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩාවන් :———.

9. සන්නද්ධ සේවයේ හෝ ස්වේච්ඡා බලසේනාවේ හෝ ශිෂ්‍ය භට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයන්හි හෝ ඔබ මීට පෙර කිනම් සේවයක් කර තිබේද ? :———.

10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද ? :———.

11. මීට ඉහතින් කිසියම් සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කළෙහිද ? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක් ද ? :——.

12. ඔබගේ පාසැල් සමය විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—
(අ) පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නම :———.
(ආ) ඇතුළත් වූ දිනය :———.
(ඇ) අස් වූ දිනය :———.
(ඈ) සමර්ථවූ ප්‍රසිද්ධ පරීක්ෂණය :———.

13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස් වූ දින සිට ඔබ නියුක්ත වී සිටින රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර දක්වන්න :———.
(අ) ස්වාමි පක්ෂය :
(ආ) රැකියාවේ ස්වභාවය :———.
(ඇ) සේවය කල කාලය :——දින සිට——දින දක්වා.

14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :—
(අ) ———.
(ආ) ———.

මෙම අයදුම් පත්‍රයෙහි ම විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

10–310—73.10.12 දින අංක 8 දරණ ගැසට් පත්‍රය

---

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

### ගුවන් විදුලි කාර්මික (II වැනි ශ්‍රේණිය) තනතුර

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ගුවන් විදුලි කාර්මික (II ශ්‍රේණිය) තනතුර සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මේ සඳහා වන අයදුම් පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කොට 1973.11.09 වැනි දිනට හෝ ඊට පෙර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, තැ. පෙ. 535, ලෝටස් පාර, කොළඹ යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

2 ඒකාබද්ධ වැටුප් පරිමාණය.—වර්ෂයකට රුපියල් 3,450 න් පටන් ගෙන රුපියල් 90 බැගින් වන වාර්ෂික වර්ධකයන් 12 කින් වර්ෂයකට රුපියල් 4,530 දක්වා වැඩි වන්නකි.

3. වයස් සීමාව.—1973.11.09 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු වන අතර, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ට ඉහත වයස් සීමාව බල නොපානු ඇත.

4. අයදුම්කරුවන්ට තිබිය යුතු අධ්‍යාපනික සහ සෙසු සුදුසුකම්.—

(අ) (i) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ, ඉංග්‍රීසි, භෞතික විද්‍යාව සහ ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) යන විෂයයන් ඇතුළු විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ)
නැතහොත්

(ii) ඉංග්‍රීසි, භෞතික විද්‍යාව සහ ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) විෂයයන් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය
නැතහොත්,

(iii) ඊට සමාන හෝ උසස් සහතික පත්‍රයක් ; සහ

(ආ) 1. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ කටුබැද්ද මණ්ඩපයෙහි හෝ වෙනත් පිළිගත් ආයතනයක ඉලෙක්ට්‍රොනික් කාර්මික විද්‍යාව (ගුවන් විදුලිය සහ විදුලි සංදේශ විද්‍යාව විෂයයන් වශයෙන් හෝ ඊට සමාන වූ යම් විෂයයන් හෝ ඇතිව) පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ;
නැතහොත්

(ii) ලංඩනයේ "සිටි ඇන්ඩ් ගිල්ඩ්" ආයතනයේ පහත සඳහන් සහතික පත්‍රවලින් යටත් පිරිසෙයින් කිසියම් සහතික පත්‍ර 4 ක් හෝ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ විසින් අනුමතිත ඊට සමාන වූ සහතික පත්‍ර.

(අ) ප්‍රායෝගික ගණිතය.

(ආ) ඉංජිනේරු විද්‍යාව.

(ඇ) මූලික විදුලි සංදේශ විද්‍යා අභ්‍යාසය.

(ඈ) විදුලි සංදේශ විද්‍යාව "ඒ" සඳහා ගණිතය

(ඉ) විදුලි සංදේශ විද්‍යා මූලධර්ම "ඒ"

(ඊ) ගුවන් විදුලිය හා මාර්ග සම්ප්‍රේෂණය "ඒ" (හෝ පරිගණකයන් "ඒ").

5. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—මෙම තනතුර ස්ථිරය. තෝරාගනු ලැබූ අයදුම්කරු රජයේ අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම ප්‍රථමයෙන් තුන් අවුරුදු පරිවාස කාල සීමවාකට යටත් වනු ඇත.

සටහන :—(i) 1971.12.31 දින රජයේ සේවයේ විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් දැරූ යම් කිසි පුද්ගලයකු පත් කළහොත් නව තනතුරෙහිද විශ්‍රාම වැටුප් හිමිකම් භුක්ති විඳීමට ඔහුට හැකි වනු ඇත.

(ii) විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් දරණ රජයේ සේවකයකු තෝරා ගනු ලැබුවහොත් පළමුකොට ඔහුගේ පත්වීම නියමිත කාලයක් සඳහා වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

6. පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම් පතට ඇමිණිය යුතුය. මෙම පිටපත් අයදුම්කරුවනට ආපසු එවනු නොලැබේ. සියලුම සහතික පත් හා ලියවිලිවල මුල් පිටපත් අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. මෙම සහතික පත්‍ර හෝ ලියවිලි කිසිවක් ඉදිරිපත් නොකිරීම අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමට හේතු වනු ඇත.

(අ) උප්පැන්න සහතිකය.

(සැ. යු.—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා සඳහා වන නියෝග සංග්‍රහයෙහි කාර්‍යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ බාරගනු නොලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

(ඈ) කලින් පළපුරුද්ද/කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ : (IIඅ) වැනි ඡේදය ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත්කිරීම් පිළිබඳව පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

8. අයදුම්පත් හෝ මේ තනතුරට අදාළ වන අනෙකුත් ලියවිලි සියල්ලක්ම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

සී. ඩබ්ලිව්. ඇම්. අපොන්සෝ,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

1973 ඔක්තෝබර් මස 02 වැනි දින,
තැ. පෙ. 535, ලෝටස් පාර,
කොළඹ 1.

අයදුම්පතෙහි ආකෘතිය

ගුවන් විදුලි කාර්මික—11 ශ්‍රේණිය තනතුර

1. සම්පූර්ණ නම :————.

2. තැපැල් ලිපිනය :————.

3. උපන් දිනය හා වයස :————.

4. ඔබ ලංකාවේ පුරවැසියකු වන්නේ :—

(i) පරම්පරාවෙන් ද, :————.

නැතහොත්

(ii) ලියාපදිංචි වීමෙන් ද ? :————.

5. සමත් වූ උසස්ම විභාගය :————.

(විෂයයන් සඳහන් කළ යුතුයි)

6. සමත් වූ කාර්මික විභාගය :————.

7. පළපුරුද්ද :————.

8. විශේෂ සුදුසුකම් හා ගිම්කම් :————.

9. දැනට කරන/කලින් කරන ලද රක්ෂාවල් පිළිබඳ විස්තර: ————.

මේ අයදුම්පතෙහි මවිසින් සපයනු ලැබ ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි විස්තර කිසිවක් අසත්‍ය බවට හෝ වැරදි බවට ඔප්පු වුවහොත් මේ පදවියට මා පත් වීමට නුසුදුසු වන බව හා පත්වීමෙන් පසුව අසත්‍යතාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහ කර දමනු ලැබීමටද හේතුවන බව හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10–432—28.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

ශ්‍රී ලංකා මහ බැංකුව

ලඝුලේඛක-යතුරු ලේඛක (ඉංග්‍රීසි) පුරප්පාඩු

1. ශ්‍රී ලංකා මහ බැංකු සේවාවේ මාණ්ඩලික නොවන පංතියේ 2 වන ශ්‍රේණියේ ලඝුලේඛක-යතුරුලේඛක (ඉංග්‍රීසි) තනතුරු සඳහා අයැදුම්පත් කැඳවනු ලැබේ. පත්වීම් මුල් අවස්ථාවේදී තාවකාලික පදනමක් මත කෙරේ.

2. අවම සුදුසුකම්.—

(i) සියළුම අයැදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ලංකා පුරවැසියන් විය යුතුයි.

(ii) අධ්‍යාපනික.—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් (ඉංග්‍රීසි භාෂාව ඇතුළුව) සමත් වී සිටීම; හෝ

(ආ) අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් එකම වරකදී අඩුම වශයෙන් විෂයයන් 6 කින් (සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය ඊට ඇතුළත් විය යුතුය.) සමත් වී සිටීම.

(ඇ) විනාඩියකට වචන 80ක වේගයෙන් කියවනු ලබන (විනාඩි 5ක කාලයක් මුළුල්ලෙහි නො නවත්වා කියවනු ලැබේ.) වචන 400 ක ඉංග්‍රීසි ඡේදයක් ලඝු හනින් ලියා ගැනීමේ සහ විනාඩියකට වචන 8 ගණනේ එම ඡේදය දිගු හනින් ඉංග්‍රීසියෙන් ලිවීමේ හැකියාවක් තිබීම; සහ වචන 300කට නො අඩු මුද්‍රිත හෝ ටයිප් කරනු ලැබූ ඡේදයක් විනාඩියකට වචන 30ක වේගයෙන් ටයිප් කිරීමට හැකිවීම. වචන 100ක් ටයිප් කිරීමේදී වැරදි 5කට වඩා නො කළ යුතු බව අපේක්ෂකයින්ගෙන් බලා පොරොත්තු වනු ලැබේ. පිළිගත් පාසලක හෝ විදුටරියක ඩිප්ලෝමා සහතිකයක් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(iii) වයස.—1973 ඔක්තෝබර් මස 27 වැනි දිනට අවුරුදු 18 කට අඩු නොවීම සහ 35 කට වැඩි නොවීම.

3. වැටුප.—මසකට $\frac{\text{රු. 345—රු. 457}}{10\times 4 \text{ හා } 12\times 6}$

මීට අමතරව විවාහ දීමනාවක් (විවාහක නම්) ගෙවනු ලැබේ.

4. අයැදුම්පත් පෝරම සහ වැඩිමනත් විස්තර ශ්‍රී ලංකා මහ බැංකුවේ (දකුණු මහල් පෙළේ 1 වැනි මහලේ) ආයතන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකිය. අයැදුම්පත් තැපැල් මගින් ලබා ගැනීමට ඊසි නම් තමන්ගේ ලිපිනය ලියා මුද්දරයක් ගැසූ අඟල් 4×9 ප්‍රමාණයේ ලියුම් කවරයක් එවිය යුතුය.

5. විධිමත්ව පිරවූ අයැදුම්පත් 1973 ඔක්තෝබර් 27 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි කොළඹ, තැපැල් පෙට්ටිය 590, ශ්‍රී ලංකා මහබැංකුවේ ආයතන අධ්‍යක්ෂ නමට එවිය යුතුය.

අයැදුම්පත් ලැබුණු බව දන්වනු නො ලැබේ.

ආයතන අධ්‍යක්ෂ.

10–482—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : සාප/14/173.

අධ්‍යාපන අමාත්‍යාංශය

බහුතාක්ෂණික ආයතනයන්හි විද්‍යාලයාධිපති තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශයේ බහුතාක්ෂණික ආයතනයන්හි විද්‍යාලයාධිපති තනතුරු සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහතින් දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත්‍ර 1973 නොවැම්බර් මස 06 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ, ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ "බහුතාක්ෂනික ආයතනයන්හි විද්‍යාලයාධිපති තනතුරු" යනුවෙන් සඳහන් කළ යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—තනතුර ස්ථිරය. තෝරාගනු ලබන අපේක්ෂකයින් දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයන් විනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයින්, පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන්නේ නම් තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයින්, දැනටම රජයේ සේවයේ නියුක්ත වී නැතිනම් මුල් වතාවේ තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කෙරෙනු ඇත. රාජ්‍ය සේවයෙහි නියැලී ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු තෝරාගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනම මත වනු ඇත.

3. වැටුප් සහ දීමනා.—රු. 14,400 ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන රු. 480 ක වාර්ෂික වැටුප් වැඩිවීම් තුනකින් සහ රු. 600 ක වාර්ෂික වැටුප් වැඩිවීම් 5 කින් රු. 18,840 දක්වා නඟින ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අදාල වේ.

මීට අනුරූපව, 1969.10.01 දිනට පෙර පැවති වාර්ෂික වැටුප් ක්‍රමය රු. 11,760—3×480—4×600—රු. 15,600 ක් විය.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) අයදුම්කරු විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව.

(ආ) 1973 නොවැම්බර් මස 06 වැනි දිනට තමන්ගේ වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ඇ) පහත සඳහන් විෂයයකින්, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් (1 වැනි හෝ 2 වැනි පන්තියේ නම් වඩා මැනවි) සහ පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ වෘත්තීය ආයතනයක පශ්චාත් උපාධියක් හෝ සමාන වෘත්තීය සුදුසුකම්.

(i) අර්ථ ශාස්ත්‍රය.
(ii) වාණිජ විද්‍යාව.
(iii) ඉංජිනේරු විද්‍යාව.
(iv) විද්‍යාව.
(v) කෘෂිකර්ම.

(ඈ) (i) යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පරිපාලනමය සහ/හෝ විධායක තරාතිරමක පළපුරුද්දක් සහිත පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ සමාන විද්‍යායතනයක කථිකාචාර්ය වරයකු වශයෙන් 15 ක් අවුරුද්දක පළපුරුද්ද, හෝ

(ii) උපාධිය ලබා ගැනීමට පසු පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ සමාන විද්‍යායතනයක යටත් පිරිසෙයින් 5 අවුරුද්දක ඉගැන්වීමේ පළපුරුද්ද සහිතව අවුරුදු 15 ක පරිපාලනමය සහ/හෝ විධායක පළපුරුද්ද. (විභාග පැවැත්වීම, සහායක කථිකාචාර්යවරු උපදේශකවරුන් ඇතුළුව අනිකුත් නිලධාරීන් අතර රාජකාරිය බෙදා දීම, සමීක්ෂණ පැවැත්වීම, වැඩසටහන්/කාලසටහන් සම්පාදනය කිරීම ආදී කටයුතුවල පරිචය ඇතිව අංශයක් භාර කථිකාචාර්ය ධුරයක් දැරීම පරිපාලනමය/විධායක පළපුරුද්ද ලෙස පිළිගන්නවා ඇත.), හෝ

(iii) උපාධිය ලැබීමෙන් පසුව අවුරුදු 5 ට නොඅඩු කාලයක් කණිෂ්ඨ කාර්මික ආයතන විද්‍යාලයාධිපතිවරයෙකු ලෙස, හෝ

(iv) I වැනි ශ්‍රේණියේ විද්‍යාලයාධිපතිවරයකු ලෙස හෝ සමාන තත්ත්වයේ හෝ ඊට උසස් තත්ත්වයක පරිපාලන පළපුරුද්ද සහිතව අවුරුදු 15 ක ඉගැන්වීමේ හා/හෝ පරිපාලන පළපුරුද්දක් තිබිය යුතුය.

(ඉ) සිංහලෙන් රාජකාර්ය කිරීමේ හැකියාව තිබීම හෝ පත්වීම ලැබීමට පසු අවුරුදු 3 ක කාලය තුළ සිංහල ප්‍රවීනතාවය ලැබීම.

**සටහන.**—ඉහත දැක්වෙන 4 වැනි ඡේදය යටතේ ඇති සුදුසුකම් සියල්ලම සම්පූර්ණයෙන් ලත් අපේක්ෂකයින් මේ සඳහා ඉදිරිපත් නොවුවහොත් 4 වෙනි ඡේදයේ (ඇ) වගන්තිය යටතේ අවශ්‍ය පශ්චාත් උපාධියක් නොමැති වුවත් අවශ්‍ය අනිකුත් සියළුම සුදුසුකම් ලබා ඇති අයද මෙම තනතුරුවලට පත් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු :—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ).

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඉ) චරිත සහතික දෙකක් මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඊ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(උ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් එවනු ලබන ඉල්ලුම්පත්‍ර සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවස්ථාවේ ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

7. ඉල්ලුම්පත්‍ර හෝ ඒ හා සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ 1 වැනි කොටසේ 2 වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහිද අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. මෙම ඉල්ලුම්පත්‍ර මේ කාර්යාලයට ලැබුණු බව ඉල්ලුම්කරුවන්ට දන්වනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 සැප්තැම්බර් මස 28 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේ දීය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළයුතුය)

**අධ්‍යාපන අමාත්‍යාංශයේ බහුතාක්ෂණික ආයතනයන්හි—විද්‍යාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. නම (මුලකුරු සහිතව) :———. මහතා/මහත්මිය/මෙනෙවිය.

2. සම්පූර්ණ නම :———.

3. රාජකාරි ලිපිනය :———.

4. පෞද්ගලික ලිපිනය :———.

5. (අ) ලාංකිකයෙක්ද යන වග :———.
   (ආ) එසේ නම්, පරම්පරාවෙන්ද, ලියාපදිංචිවීමෙන්ද ? :———.

6. උපන් දිනය :— අවුරුද්ද :——, මාසය :——, දිනය :——.

7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :——, අවු :——, මාස :——, දින :——.

8. දැනට දරණ තනතුරු පිළිබඳ විස්තර :—
   (අ) තනතුර :———.
   (ආ) ස්ථිරද, තාවකාලිකද ? :———.
   (ඉ) විශ්‍රාම වැටුප් සහිතද, රහිතද ? :———.
   (ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :———.
   (උ) දෙපාර්තමේන්තුව :———.
   (ඌ) ආයතනය/සේවා ස්ථානය :———.
   (එ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :———.
   (ඒ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :———.

9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර—(සිංහල ප්‍රවීණතාවය/දෙමළ භාෂාව පිළිබඳ ලබා ඇති සහතික ද ඇතුළුව) :—

| | විභාගය | වර්ෂය | |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

10. වෘත්තීය / සුදුසුකම් පිළිබඳ විස්තර :—

| | සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |
| 5. | | | | |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතන :—

| | ආයතනය | පංතිය | සිට — දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |
| 8. | | | |

12. වෘත්තීය අධ්‍යාපනය ලද ආයතන :—

| | ආයතනය | පාඨමාලාව | සිට—දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

13. කලින් දරූ තනතුරු : (නියම දිනයන් දක්වමින් හරියට ම වකවානු පිළියෙලට සඳහන් කරන්න)

| දෙපාර්තමේන්තුව | ආයතනය / සේවා ස්ථානය | තනතුර | ස්ථිරද තාවකාලික | සිට. | දක්වා |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |

14. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරු වී ඇත්තේද? :—....................... (එසේ නම් විස්තර දක්වන්න)

15. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබුවේද? :—... .................................. (එසේ නම් විස්තර දක්වන්න)

16. ඔබ මුදල් කරදර වලින් නිදහස්ද? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? ...............................

17. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරනලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

.........................................

අයදුම්කරුගේ අත්සන.

දිනය :.........................................

10-294—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : 1/102/53 (ජී)

**භාෂා පරිවර්තක සේවයට බඳවාගැනීමේ විභාගය—1973 පෙබරවාරි**

1973 පෙබරවාරි මස 24 වැනි දින පවත්වන ලද ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල මත පහත සඳහන් අපේක්ෂක/අපේක්ෂිකාවන් භාෂා පරිවර්තක සේවයට පත් කිරීම පිණිස තෝරාගෙන ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | ලිපිනය |
|---|---|
| 1. එස්. කනගසිංහම් | මහජන සෞඛ්‍ය පරීක්ෂක, මොරවක සෞඛ්‍ය කාර්යාලය, කොටපොල. |
| 2. පී. වී. ඩී. එල්. සැම්සන් | 50, බාලසූරිය මාවත, දකුණු බටගම, කඳාන. |
| 3. ඒ. ඒ. ජෝන් | මහජන සෞඛ්‍ය පරීක්ෂක, පලාවි (පුත්තලම) |
| 4. එම්. පී. ජිනදාස | ජල විද්‍යා අංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කොළඹ 7 |
| 5. ඊ. ඒ. සී. එදිරිසූරිය | ධර්මලෝක කණිෂ්ඨ විද්‍යාලය, කැලණිය. |
| 6. පී. එච්. ලියනගේ | ක/මාපුටුගල මහා විද්‍යාලය, පෝරුවේ දන් ඩ. |
| 7. ඇර්. එස්. ජයසිංහ | ප්‍රාදේශීය මැනුම් කාර්යාලය, මහනුවර |
| 8. ඒ. ජී. නිව්ටන් | සියඹලාගහ කොරටුව, තල්අරඹ, කඹුරුගමුව. |
| 9. ඒ. සී. සිවසුබ්‍රමනියම් | තක්සේරු අංශය, නගරශාලාව, කොළඹ 7. |
| 10. පී. බී. පෙරේරා | පොලිස් කාර්යාලය, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 7. |
| 11. එච්. ඩී. එල්. ද සිල්වා | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, උ. වී. ගෙ. ශාඛාව, කොළඹ 1. |
| 12. කේ. එම්. එන්. සී. රුද්‍රිගු | තැ. පෙ. 306, තැ. හා විදුලි සංදේශ ගබඩාව, මරදාන |
| 13. එල්. කොළඹගේ | දිස්ත්‍රික් උසාවිය, යාපනය. |
| 14. එස්. එම්. ද සිල්වා | දෙමටඑව විද්‍යාලය, දෙමටඑව. |
| 15. එස්. වික්‍රමආරච්චි | සංස්කෘතික අමාත්‍යාංශය, කොළඹ 7. |
| 16. පී. එන්. ආර්. ප්‍රනාන්දු | 33, සමුද්‍ර මාවත, උයන් කැලේ, පානදුර |
| 17. කේ. ඒ. යසරත්න | අපරාධ ඇපැල් අධිකරණ අංශය, ශ්‍රේෂ්ඨාධිකරණය, කොළඹ 12. |
| 18. ආර්. ඩී. කුලතිලක | 60 (ඒ), බුළුගහගොඩ, බොල්ලත (බ.ප.) |
| 19. එච්. සිරිසේන | 121. " පෙරමුණ ", ගොතටුව, අංගොඩ. |
| 20. කේ. එම්. එම්. එල්. ද සිල්වා | 116, ශ්‍රී ගුණානන්ද මාවත, කොටහේන කොළඹ 13. |
| 21. ජී. ලක්ෂමන් සිල්වා | 617/2, ජයපාර, උඩහමුල්ල, නුගේගොඩ |
| 22. ජී. ආර්. ඒ. මල්ලිකා | රාජ්‍ය සංස්ථා අංශය, මහා භාණ්ඩාගාරය, කොළඹ 1. |
| 23. එන්. සිවකුමාරන් | රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව, කොළඹ 7. |
| 24. ඩබ්. එම්. සෝනාරත්න | පල්ලෙදෙල්තොට විද්‍යාලය, ගලහ (මහනුවර හරහා) |
| 25. පී. එල්. ප්‍රනාන්දු | 76, වෙලඳ පෙදෙස, අනුරාධපුරය. |
| 26. ඒ. එම්. මොහොම්මදු මදනි | 106, ඕගොඩපොල, රුග්ගහවිල. |
| 27. ඒ. ජී. ඊ. සී. සේනාරත්න | " සැනසුම " සිරි ජේවත මාවත, වෙහෙරහේන, මාතර |
| 28. ආර්. ජී. ජයරත්න | විධායක ඉංජිනේරු කාර්යාලය, මිහින්තලේ. |
| 29. කේ. සභාරත්නම් | අවරන්කල්, පුත්තූර්. (එන්පී), |
| 30. ජේ. සමරවීර | ගා/මහින්ද විද්‍යාලය, ගාල්ල. |

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරල් වෙනුවට.

1973 සැප්තැම්බර් 21 දින,
කොළඹ 7, රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේ දී ය.

10-297—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**සිංහල මාධ්‍ය තැපැල් මාර්ගික පුහුණුව සඳහා ගුරුවරුන් තෝරා ගැනීම**

**සාමාන්‍ය පාඨමාලාව—1974**

(1974න් පසු මෙම පාඨමාලාව සඳහා ගුරුවරුන් බඳවාගනු නොලැබේ)

1. (i) රැකියාවෙහි යෙදී සිටින අතරම තැපැල් මාර්ගයෙන් ගුරුවරුන් පුහුණු කිරීම පිළිබඳ සාමාන්‍ය පාඨමාලාවට ඉල්ලුම් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

(ii) මෙම සාමාන්‍ය පාඨමාලාව ප්‍රාථමික පාඨශාලා 1–5 දක්වා ශ්‍රේණිවල සියලුම විෂයයන් ඉගැන්වීම් වස් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා වේ. අවසාන විභාගය, සහතික පත්‍ර ප්‍රදානය හා වැටුපද සම්බන්ධයෙන් මෙම පුහුණුව ගුරු විදුහල්වලට ඇතුළත්ව කෙරෙන සාමාන්‍ය පුහුණුවට සමානය. තැපැල් මාර්ගික පුහුණුවේ කාලය අවුරුදු තුනකි.

(iii) මෙම පුහුණුව ලබන ගුරුවරුන් ඇප ඔප්පු භාරදීම, වාර විභාග, නිවාඩු කාලීන හා සේවාස්ථ පුහුණුව, සඳහා ගුරු විදුහලකට සම්බන්ධ කරනු ඇත. වාර විභාගවලට පෙනී සිටීම, පාසල් නිවාඩු කාලය තුළ පැවැත්වෙන නේවාසික පාඨමාලාවන්ට සහභාගි වීම, ගුවන් විදුලි වැඩ සටහන්වලට සවන් දීම ආදියද පුහුණුවේම කොටසක් ලෙස සැලකේ.

(iv) පාඩම් මුද්‍රණය කිරීම, තැපැල් කිරීම ආදියේ ගාස්තු වශයෙන් මෙම පාඨමාලාව හදාරන ගුරු භවතුන් වර්ෂයකට රු. 25ක මුදලක් ගෙවිය යුතුය.

(v) තම සාමාන්‍ය හැසිරීමේ හා ඉගෙනීමේ උද්යෝගිභාවය සම්බන්ධයෙන් ගුරු අධ්‍යාපනය භාර අධ්‍යක්ෂවරයා තෘප්ත කිරීමට අසමත් වන පුහුණුව ලබන්නන් පාඨමාලාව හැදෑරීමෙන් අත්හිටවනු ලැබේ. මේ කාරණය සම්බන්ධයෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(vi) පුහුණුව ලබන්නෙකුට තම පාඨමාලාව හදාරන කාලය තුළ වෙනත් බාහිර පාඨමාලාවක් හැදෑරීමට හෝ බාහිර විභාගයකට පෙනී සිටීමට හෝ සාමාන්‍යයෙන් ඉඩ දෙනු නොලැබේ.

2. **ඇතුළත් කිරීම**.—(i) මෙම පාඨමාලාව පහත සඳහන් වර්ගවලට අයත් අයදුම්කරුවන් සඳහා අදාල නොවේ. එබඳු අයකු ඇතුළත් වුවහොත් මේ පාඨමාලාව පැවැත්වෙන කාලය තුළ හෝ ඉන්පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ ඇතුළත් කිරීම අවලංගු කරනු ලැබේ.

(අ) දැනටමත් ගුරු විද්‍යාලයක පුහුණුව ලබා ඇති හෝ ලබන ගුරුවරුන්,

(ආ) උපාධිය ලබා ඇති ගුරුවරුන්,

(ඇ) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර 4 වැනි ඡෙදයේ සඳහන් සුදුසුකම් පිළිබඳ කොන්දේසි සියල්ල සම්පූර්ණ කර නොමැති අය.

(ii) තැපැල් මාර්ගික පුහුණුව සඳහා සෑම අයදුම්කරුවකු විසින්ම ඇතුළත් කරගනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත රු. 1,000ක වටිනාකමින් යුත් බැඳුම්කරයක් පහත සඳහන් නියමයන්ද පිළිපදින බවට පොරොන්දු වෙමින්, අවශ්‍ය සියලුම ලියකියවිලි සමඟ තමා සම්බන්ධ කර ඇති ගුරු විදුහලේ විදුහල්පතිවරයා/වරිය වෙත සැපයිය යුතුය.

(අ) කවර හේතුන් නිසා හෝ පුහුණුවීමේ පාඨමාලාව අත් නොහරින බවට,

(ආ) පුහුණු පාඨමාලාව නිම කිරීමෙන් පසු අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහු/ඇය පත් කරනු ලබන පාසල්වල අවුරුදු තුනක කාල පරිච්ඡෙදයක් නොකඩවා සේවය කරන බවට (රජයේ නොවන පාසල්වල නියුක්ත ගුරුවරුන් විසින් එපරිදිම අවුරුදු තුනක කාල පරිච්ඡෙදයක් එම පාලක මණ්ඩලය යටතේම ඇති පාසල්වල හෝ රජයේ පාසල්වල හෝ සේවය කරන බවට මෙම දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය).

3. වැටුප.—තම පාඨමාලාව සතුටුදායක ලෙස නිම කර පුහුණු ගුරු පත්වීම් ලබන ගුරුවරුන්ට පුහුණු ගුරු සහතිකය වලංගු වන දින සිට ඔවුන්ට අදාල වැටුප් ක්‍රමය මත වැටුප් ගෙවනු ඇත.

4. **සුදුසුකම්**.—අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(i) 1974 ජනවාරි මස 1 වැනි දිනට යටත්පිරිසෙයින් තුන් අවුරුදු ඉගැන්වීමේ පළපුරුද්දක්,

(ii) 1974 ජනවාරි මස 1 වැනි දිනට අවුරුදු 35 ට වැඩි විය යුතු අතර 49ට අඩු විය යුතුය.

(iii) සිංහල භාෂාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ලබා තිබිය යුතුය. නැත්නම් අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය සහිතව විෂයයන් 6කින් සාමාර්ථය ලබා තිබිය යුතුය.

5. 4(i) ඡෙදයේ කාර්‍යයන් සඳහා තෝරා ගැනීමේ ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක ගුරු මණ්ඩලයේ සේවයෙහි නියුක්ත අය ගුරුවරුන් ලෙස ගණන් ගනු ලැබේ. පිළිගත් පෞද්ගලික පාසලක ස්ථිර ගුරු මණ්ඩලයේ නියුක්ත, සාමාන්‍ය පන්තිවල සතියකට පැ. 20ක් වැඩ කරන ගුරුවරුන්ද ගුරුවරුන් ලෙස ගණන් ගනු ලැබේ. මෙම කාර්‍යය සඳහා පහත සඳහන් ආයතන පිළිගත් පෞද්ගලික පාසල් ලෙස සලකනු ලැබේ. :—

(අ) 1951 දී ගාස්තු අය කරන පාසල් බවට පත්වූ උපකෘත පාඨශාලා,

(ආ) 1960 දෙසැම්බර් මස 1 වැනි දින ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් බවට පත්වූ I වැනි හා II වැනි ශ්‍රේණියේ පාඨශාලා.

6. **තෝරාගැනීම සඳහා ඉල්ලුම් කිරීම**.—(i) මෙම ගැසට් නිවේදනයේ දක්වෙන ආදර්ශ ආකෘතිය අනුව අයදුම්කරු විසින් පිළියෙල කරගනු ලබන අයදුම්පතක් සම්පූර්ණ කොට එමගින් ඉල්ලුම් කළ යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මුද්‍රිත ෆෝරම් නිකුත් කරනු නොලැබේ. ඉල්ලුම් පත්‍රය පිළියෙල කිරීමේදී පහත සඳහන් නියමයන් තරයේ පිළිපැදිය යුතුය. මින් කවර හෝ නියමයක් නොසලකා හැරීම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වන්නේය.

(අ) ආකෘති පත්‍රය දළ වශයෙන් 16'' × 13'' ෆුල්ස්කැප් පිටුවක පිළියෙල කළ යුතු අතර වෙනත් කවර හෝ කඩදාසියක පිළියෙල නොකළ යුතුය.

(ආ) ආකෘති පත්‍රය යතුරු ලිවීමෙන් පිළියෙල කරගත හැකිය. එය අත් අකුරින් පිළියෙල කරන්නේ නම්, රේඛා ඇඳිය යුත්තේ රතු තීන්තෙනි. කොටු පිරවීම කළ යුත්තේ නිල් හෝ කළු තීන්තෙනි.

(ඇ) කොටු ඉරි ගසා පිළියෙල කරගත යුතු අතර, ඒවා ක්‍රමානුකූලවත් නිවැරදි පිටුවේත් විය යුතුය. එකම කොටසක් වත් වෙනස් කිරීම හෝ අත්හැරීම නොකළ යුතුය. කොටු අතර ඉඩ ප්‍රමාණය සැලකිල්ලෙන් වෙන් කළ යුතු අතර, එකිනෙකට හොඬ ගැසෙන සේ පිළියෙල නොකළ යුතුය.

(ii) අයදුම්කරු විසින් ඉල්ලුම් පත්‍රය නොඅඩුව හා නිවැරදිව පිරවිය යුතුය. අසම්පූර්ණ ඉල්ලුම් පත්‍රයක් එහි අන්තර්ගත විස්තර අනුව තීරණය කරන අතර, ප්‍රතික්ෂේප කිරීමටද ඉඩ තිබේ. පහත සඳහන් කරුණු කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ :—

(අ) ගුරුවරයකු විසින් තම නම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති පරිදිම සඳහන් කළ යුතුය.

(ආ) සෑම ගුරුවරයකුම තමාගේ පත්වීමේ දිනය හා ලියාපදිංචි අංකය නිවැරදිව සඳහන් කළ යුතුය.

(ඇ) ඉල්ලුම් පත්‍රය ගුරුවරයා සේවය කරන පාසලේ ප්‍රධානියා මගින් හෝ මුල් ගුරුවරයෙක් නම් මා.අ.නි. මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය කවරයක් තුළ බහා, එම කවරයේ වම් පැත්තේ උඩින්, '' තැපැල් මාර්ගික ගුරු පුහුණුව—සාමාන්‍ය පාඨමාලාව '' යයනුවෙන් පැහැදිලිව ලිවිය යුතුය.

(ඉ) ඉල්ලුම් පත්‍ර 1973 නොවැම්බර් මස 15 වැනි දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අධ්‍යාපන අධ්‍යක්ෂ (ගුරු අධ්‍යාපන),
තැ. පෙ. අංක 1518, කොළඹ.

(iii) ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වනු නොලැබේ.

(iv) ඉල්ලුම් පත්‍රයට ලියකියවිලි අමුණා එවිය යුතු නොවේ.

පී. උඩගම,
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 සැප්තැම්බර් මස 21 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

### 1974 දී තැපැල් මාර්ගික ගුරු පුහුණුව සඳහා තෝරාගැනීමේ ඉල්ලුම් පත්‍රය

### සිංහල මාධ්‍යය—සාමාන්‍ය පාඨමාලාව

1. ස්ත්‍රී පුරුෂ භාවය අදාල කොටුවේ × මගින් පෙන්වන්න.

පිරිමි ☐ ගැහැණු ☐

2. සම්පූර්ණ නම (පෙළපත් නාමය මුලට) :————,
3. පත්වීමේ දිනය :————.
4. ගුරුවරයකු වශයෙන් ලි.ප. අංකය :————.
5. පාසල් ලිපිනය :————.
   වර්ගය: රජයේ/ගාස්තු අය නොකරන පුද්ගලික/පුද්ගලික :————.
   අධ්‍යාපන දිස්ත්‍රික්කය :————.
   ඡන්ද කොට්ඨාශය :————.
6. ස්ථිර ලිපිනය :————.
   දිස්ත්‍රික්කය :————.
   ඡන්ද කොට්ඨාශය :————.
7. උපන් දිනය :————.
   උපන් දිස්ත්‍රික්කය :————.
8. 1974 ජනවාරි 1 වැනි දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.
9. සමත්වූ උසස්ම විභාගයේ විස්තර

| විභාගයේ නම | සහතිකයේ අංකය | දිනය | සමත්වූ විෂයයන් |
|---|---|---|---|
| අන්තර් මධ්‍යම සාමාන්‍ය කලා යෝග්‍යතා පරීක්ෂා | | | |
| සාමාන්‍ය විද්‍යා යෝග්‍යතා පරීක්ෂා | | | |
| අ.පො.ස. (උ.පෙ.) | | | |
| ගුරු සහතිකය— | | | |
| I පෙළ | | | |
| II පෙළ | | | |
| III පෙළ | | | |

10. අ.පො.ස. (සා.පෙ.) ජ්‍යෙෂ්ඨ පා.ස. විභාගයේදී ලබා ඇති ශ්‍රේණීන් මේ අන්දමට ලකුණු කළ යුතුය

සා = සාමාර්ථ
ස = සම්මාන
වි = විශිෂ්ඨ

| විභාගය | වර්ෂය හා මාසය | සහතිකයේ අංකය | සමත්වූ විෂයයන් හා ලබාගත් ශ්‍රේණි |
|---|---|---|---|
| අ.පො.ස. (සා.පෙ.) | | | |
| ජ්‍යෙෂ්ඨ පා.ස. | | | |

11. සේවා විස්තර :

| පාසලේ නම, ලිපිනය | දිස්ත්‍රික්කය | පත්වීමේ දින | ස්ථාන මාරුවීමේ දිනය |
|---|---|---|---|
| | | | |

12. ඉල්ලුම්කරුගේ ප්‍රකාශය :

ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තර නිවැරදි බවට සහතික කරමි. ඉල්ලූ විටක සාක්ෂ්‍ය ඉදිරිපත් කරන්නෙමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

13. පාසල් ප්‍රධානියාගේ සහතිකය :

ඉහත නම සඳහන් ඉල්ලුම්කරු—
(i) මගේ පාසලේ උප ගුරුවරයකු/මුල් ගුරුවරයකු බව,
(ii) ————දින සිට ඔහුගේ/ඇයගේ වැඩ සතුටුදායක බව,
(iii) සහතික පත් ලත්/සහතික පත් නොලත් ගුරු භවතකු බව,
(iv) මා ඉදිරියේ මෙම ආකෘතියේ අත්සන තැබූ බව මෙයින් සහතික කරමි.

මා.අ.නි./පාසල් ප්‍රධානියාගේ නම :————.

තරාතිරම හා රාජකාරි ලිපිනය :————.

————,
මා.අ.නි./පාසල් ප්‍රධානියාගේ අත්සන.
දිනය :————.

10-431—73.10.12 දින අංක 81 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය** සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. **සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

සැ. යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ඔක්තෝබර් | 73.10.05 | සිකුරාද | ... | 73.09.25 | අඟහරුවාද | දවල් | 12.00 |
| | 73.10.12 | සිකුරාද | ... | 73.10.03 | බදද | දවල් | 12.00 |
| | 73.10.19 | සිකුරාද | ... | 73.10.10 | බදද | දවල් | 12.00 |
| | 73.10.26 | සිකුරාද | ... | 73.10.17 | බදද | දවල් | 12.00 |
| නොවැම්බර් | 73.11.02 | සිකුරාද | ... | 73.10.24 | බදද | දවල් | 12.00 |
| | 73.11.09 | සිකුරාද | ... | 73.10.31 | බදද | දවල් | 12.00 |
| | 73.11.16 | සිකුරාද | ... | 73.11.07 | බදද | දවල් | 12.00 |
| | 73.11.23 | සිකුරාද | ... | 73.11.14 | බදද | දවල් | 12.00 |
| | 73.11.30 | සිකුරාද | ... | 73.11.21 | බදද | දවල් | 12.00 |
| දෙසැම්බර් | 73.12.07 | සිකුරාද | ... | 73.11.28 | බදද | දවල් | 12.00 |
| | 73.12.14 | සිකුරාද | ... | 73.12.05 | බදද | දවල් | 12.00 |
| | 73.12.21 | සිකුරාද | ... | 73.12.12 | බදද | දවල් | 12.00 |
| | 73.12.28 | සිකුරාද | ... | 73.12.19 | බදද | දවල් | 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.